**කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**
**පොල් වගාකිරීමේ මණ්ඩලය**
**තනතුරු පුරප්පාඩු - 2024**

**පොල් වගාකිරීමේ මණ්ඩලයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා**
**ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**තනතුර: රියදුරු III ශ්‍රේණිය PL 3**

**සේවා ස්ථානය :- සේවා අවශ්‍යතාවය මත ප්‍රධාන කාර්යාලය සහ දිවයිනපුරා - තනතුරු 07**

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

බාහිර සුදුසුකම් - ''රියදුරු'' තනතුර

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් වත් සහිතව විෂයන් හය (06) කින් සමත් වී තිබීම.

සහ

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලබන වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් ලබා තිබීම හා බලපත්‍රය ලබාගැනීමෙන් පසු රියදුරෙකු වශයෙන් වසර 03ක සේවා පළපුරුද්දක් තිබීම.

අභ්‍යන්තර සුදුසුකම් - ''රියදුරු'' තනතුර

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරනු ලබන වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් ලබා තිබීම හා බලපත්‍රය ලබාගැනීමෙන් පසු රියදුරෙකු වශයෙන් වසර 03ක සේවා පළපුරුද්දක් සහිත මණ්ඩලයේ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) හෝ අර්ධ ශිල්පීය (PL 2) සේවා ගණයක වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

| | |
|---|---|
| **වැටුප් කාණ්ඩය** | : PL - 3 |
| **වැටුප් පරිමාණය** | : රු. 26,290 - 270x10 - 300x10 – 330x10 – 350x12 - 39,490 |
| **දීමනා** | : ජීවන වියදම් දීමනාව රු. 17,800 ඇතුළු රජයේ අනෙකුත් දීමනා |
| **වයස** | : අවු : 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ. |

**වෙනත් කොන්දේසි :**

I. සෑම ඉල්ලුම්කරුවෙක් ම, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්පත් :**

- **ඒ අනුව 2024.05.27 දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහත වෙබ් අඩවියේ ඇති ආදර්ශ ආකෘතියට අනුව හෝ තමන් විසින් සකස් කර ගත් ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමුකළ යුතුවේ.** එමෙන්ම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි සහතිකවල සහතික කළ පිටපත් සමඟ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ යොමු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.
- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. එසේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- සියලුම අයදුම්පත් 2024.05.27 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **''සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල''** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වේනොත්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සළකා කටයුතු කරනු ලැබේ.

**අදාළ අයදුම්පත් පහත වෙබ් අඩවියෙන් බාගත කරගන්නා ලෙස දන්වමි.**
**http://coconutsrilanka.lk**

**කෘෂිකර්ම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**

**පොල් වගාකිරීමේ මණ්ඩලය**

**අංක 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**

**බත්තරමුල්ල**

**දුරකථන: 011 -2861331**

---

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

## පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයෙහි රියදුරු (PL 3) III ශ්‍රේණිය තනතුරු සඳහා ආදර්ශ අයදුම් පත්‍රය.

1.0 පෞද්ගලික තොරතුරු:

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :- ..................................................
.................................................................................................................. උදා : SILWA A.B.K.

1.2 සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :- ..................................................................................
..................................................................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :- ........................................................................................
..................................................................................................................................

1.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :- .................................................................................
..................................................................................................................................

1.5 පෞද්ගලික ලිපිනය(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..........................................................................
..................................................................................................................................

1.6 ස්ත්‍රී / පුරුෂ භාවය :- ..........................................................

1.7 විවාහක / අවිවාහක බව :- ..........................................................

1.8 ජන වර්ගය :- ..........................................................

1.9 ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

1.10 උපන් දිනය :- වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

1.11 දුරකථන අංකය :-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

1.12 දිස්ත්‍රික්කය:-.......................................................................................

1.13 ඡන්ද කොට්ඨාසය :-...................................................................................

1.14 ග්‍රාම නිලධාරී කොට්ඨාසය:-........................................................................

1.15 විද්‍යුත් ලිපිනය :-....................................................................................

2.0 අධ්‍යාපන සුදුසුකම්

2.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය: වර්ෂය :- .......................... විභාග අංකය :- ..............................

| | විෂය | සාමාර්ථය | | විෂය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 01. | | | 06. | | |
| 02. | | | 07. | | |
| 03. | | | 08. | | |
| 04. | | | 09. | | |
| 05. | | | 10. | | |

2.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය:වර්ෂය :- .......................... විභාග අංකය :- ..............................

| | විෂය | සාමාර්ථය |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |
| 04. | | |

3.0 වෘත්තීය සුදුසුකම්:

| |
|---|
| |

4.0 වෙනත් සුදුසුකම්:

| |
|---|
| |

5.0 ඔබ ගැන තොරතුරු විමසිය හැකිඥාතීන් නොවන දෙදෙනෙකු පිළිබඳ විස්තර:

| නම / දුරකථන අංකය | තනතුර | ලිපිනය |
|---|---|---|
| | | |
| | | |

6.0 අයදුම්කරුගේ සහතිකය:

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

.................................. ....................................

දිනය අයදුම්කරුගේ අත්සන

7.0 අත්සන සහතික කිරීම:

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ......................................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් .............................. දින මා ඉදිරියේදී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

...............................................

අත්සන සහතික කරන ලද
නිලධාරියාගේ අත්සන

නම : ..............................................................................................................................

තනතුර : ..............................................................................................................................

ලිපිනය :.............................................................................................................................

දිනය : ..............................................................................................................................

8.0 අයදුම්කරු මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවකයකු නම් දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශ ප්‍රධානියාගේ සහතිකය:

.............................................................................................මහතා/මහත්මිය/මෙනවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු / ඇය මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අභ්‍යාසලාභී/අනියම් නිලධාරියෙක්/ නිලධාරිණියක් වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.(අනවශ්‍ය වචන කපා හරින්න)

...............................................

දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ
ප්‍රධානියාගේ/බලයලත් නිලධාරියාගේ අත්සන.

දිනය : ...........................................................................................................................

නම : ...........................................................................................................................

තනතුර: ...........................................................................................................................

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව: .........................................................................................